# ත්‍රිපිටකයේ ඓතිහාසික සංවර්ධනය

## The historical development of Tripitaka

වැලිවිට සොරත හිමි

**Abstract**

Pali tripiṭaka is recognized 'the doctrine which was discoursed throughout forty five years by the Buddha and complied in to three baskets; Sutta, Vinaya and Abhidhamma'. By the time of the Buddhist council, the entire discourse was identified with the common name of Dhamma-vinaya. It was later compiled in to three baskets and is enduring to the present. This discourse was included in thirty one (31) books within the Sri Lankan tradition whereas the Burmese tradition accepts thirty five (35) books. Sri Lankan tradition accepts Sutta Piṭaka including all 19 books with four main books called nikayas and 15 books in Khuddakanikaya, Vinaya Piṭaka with five books and Abhidhamma Piṭaka with seven books. The Burmese tradition has developed with four other books named Nettippakarana, Peṭakopadesa, Milindapanha and Suttasangaha included in Khuddakha nikaya. It is suggested that this difference can be seen because the Sri Lankan Pali literature has been developed before the Burmese Pali literature. However, it is difficult to suggest that the tipiṭaka books in four other nikayas in both traditions are written at the same era. Even though the commentator shave stressed that the all three baskets Sutta, Vinaya and Abhidhamma are completely compiled at the first Buddhist council, it is clear with the facts included in the tipiṭaka itself that they are developed throughout the period from the first to the third Buddhist council. Navangasattusāsanaya gives another point of view on the tipiṭaka (triple baskets) complement.

Various comments are given by the contemporary scholars like K.R. Norman and B.C. Law regarding the development of the tipiṭaka. Thus, different views in relation to the development of the tipiṭaka are analyzed in this research article.

**Keywords:** Sutta Piṭaka, Vinaya Piṭaka, Abhidhamma Piṭaka, Development, Views, Dhamma-vinaya

**සාරසංක්ෂේපය**

පාලි ත්‍රිපිටකය යනුවෙන් හැඳින්වෙන්නේ බුදුරජාණන් වහන්සේ විසින් පන්සාළිස් වසක් මුළුල්ලේ දේශනා කරන ලද, පශ්චාත්කාලීනව සූත්‍ර, විනය හා අභිධර්ම වශයෙන් බෙදා වෙන් කරන ලද කොටස් තුනය. ධර්ම සංගායනා අවධිය වනවිට සියලු දේශනා පැවතියේ ධම්ම-විනය යන පොදු නාමය යටතේ පමණි. එහෙත් පසුකාලීනව ‘ත්‍රිපිටක’ යනුවෙන් බෙදා වෙන් කළ බුද්ධ දේශනා වර්තමානය දක්වා ම සුරක්ෂිතව පවතී. මෙම බුද්ධ දේශනා ඇතුළත් ග්‍රන්ථ තිස් එකක් (31) ශ්‍රී ලාංකේය ශාසන සම්ප්‍රදාය පිළිගන්නා අතර, බුරුම ශාසන සම්ප්‍රදායට අනුව එම ග්‍රන්ථ සංඛ්‍යාව තිස් පහකි. (35) සූත්‍ර පිටකය මුල් නිකාය ග්‍රන්ථ හතර (04) හා ඛුද්දක නිකායේ ග්‍රන්ථ පහළොවක් සමග කොටස් දහනවයකින් ද, (19) විනය පිටකය කොටස් පසකින් ද, (05) අභිධර්ම පිටකය ග්‍රන්ථ හතකින් ද (07) ශ්‍රී ලංකා සම්ප්‍රදාය ත්‍රිපිටකය පිළිගනියි. බුරුම සම්ප්‍රදාය ඛුද්දක නිකායේ ග්‍රන්ථ පහළොවට නෙත්තිප්පකරණ, පෙටකොපදෙස, මිළින්දපඤ්හ හා සුත්තසංගහ යන ග්‍රන්ථ හතර ද එකතු කර තිබේ. බුරුම පාලි සාහිත්‍යයේ සංවර්ධනය පසුකාලීනව සිදු වී ඇති අතර ඊට පෙර ලාංකික පාලි සාහිත්‍යය සංවර්ධනය වීමත් නිසා මෙම ග්‍රන්ථ සංඛ්‍යාව අඩු වී ඇති බව සිතිය හැකිය. කෙසේ වෙතත් මෙම සම්ප්‍රදාය දෙක අතරින් ලාංකික පාලි සාහිත්‍යයේ ත්‍රිපිටකයට අයත් කෘති ද එකම කාලවකවානුවක සංගෘහිත වූ ඒවා යැයි සැලකිය නොහැක. අට්ඨකථාචාරීන්ගේ මතය අනුව සූත්‍ර, විනය හා අභිධර්මය පළමු සංගායනාවේ දී සංගෘහිත වූයේ යැයි සඳහන් වුවත්, එහිම දැක්වෙන කරුණු අනුව තුන්වන ධර්ම සංගායනා අවධිය දක්වාම එකී සංවර්ධනය සිදු වී ඇති බව පැහැදිලි වේ. ත්‍රිපිටක බෙදීම්

පිළිබඳ නවාංගසත්ථු සාසනයේ ද වෙනත් මතයක් දරයි. මෑතකාලීන කේ. ආර්. නෝර්මන්, බී. සී ලෝ ආදි පඬිවරුන් විසින් ද ත්‍රිපිටකයේ සංවර්ධනය පිළිබඳ විවිධ මත ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම පර්යේෂණ ලිපියෙහි පාලි ත්‍රිපිටකයේ සංවර්ධනය පිළිබඳ පවතින විවිධ මතවාද ඉදිරිපත් කෙරේ.

**යතුරු පදඃ** සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්ම පිටකය, සංවර්ධනය, මතවාද, ධම්ම-විනය

**හැඳින්වීම**

බුද්ධ වචනය පළමුවෙන් ත්‍රිපිටකය යන නාමයෙන් වර්ගීකරණය වූයේ පළමු සංගායනාවෙන් පසුවය. මෙහි ත්‍රිපිටක යනු තුන් පිටකයයි. ඒ අනුව පිටක යනුවෙන් හැඳින්වෙන්නේ යම් කිසිවක් රැස් කොට තබන ලද කූඩය හෝ වට්ටිය යන්නයි. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාල පිටකං ආදාය" (මහණෙනි, යම්සේ පුරුෂයෙක් උදැල්ල හා කූඩය රැගෙන එන්නේ නම්) යන්න පාලි සූත්‍රවල දක්නට ලැබේ. (මජ්ඣිම නිකාය, 2013ඃ 318) මේ පිළිබඳ අට්ඨකථා විවරණයේ දී ''යං කිඤ්චි භාජනම්පි, තස්මා පිටකං පිටකත්ථවිදූ පරියත්තිභාජනත්ථතො ආහ'' (සුමංගලවිලාසිනි, 1918ඃ 14) යනුවෙන් යම්කිසි භාජනයක් යන අර්ථය සපයයි. 'පරියත්ති' යනු බුද්ධ දේශනාවයි. ඒ අනුව එම සියලු දේශනා වෙන් වෙන් වශයෙන් රැස් කර තැබූ භාජන වශයෙන් සලකා මෙයට 'පිටක' යන නම යොදන ලදැයි සිතිය හැකිය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ පසු පැවැත් වූ ප්‍රථම ධර්ම සංගීතියේ දී සමස්ත බුද්ධ වචනය විනය, සූත්‍ර හා අභිධර්ම වශයෙන් පිටක තුනක් යටතේ සංගෘහිත වූ බව ඓතිහාසික වාර්තා ඉදිරිපත් කර ඇති චුල්ලවග්ගපාළියේ පඤ්චසතිකක්ඛන්ධකකයේ සඳහන් වේ.

> ''උපාලිං විනයං පුච්ඡි සුත්තන්තානන්ද පණ්ඩිතං
>
> පිටකං තීණි සංගීතං අකංසු ජිනසාවකා''
>
> (චුල්ලවග්ග පාළි, 2013ඃ 564).

යන ගාථාවෙන් ඒ බව පැහැදිලි වේ. එහෙත් මෙම ගාථාව චුල්ලවග්ග පාළියේ උද්දානයේ හෙවත් අවසානයේ දැක්වෙන සමාප්ති ගාථාවල දක්නට ලැබේ. ඒවා පසුකාලීන යැයි විශ්වාස කෙරේ. එම නිසා ත්‍රිපිටක යන වචනය මුල් අවධියේ දී ම භාවිත කළේ ද යන්න පිළිබඳ නිගමනයකට පැමිණිය නොහැක.

ථෙරවාදීන්ගේ සාම්ප්‍රදායික පිළිගැනීම මෙය වුවත් ත්‍රිපිටකයේ සඳහන් සූත්‍ර හා ඒවායෙහි අන්තර්ගත කරුණු, ශෛලිය හා දේශනා ක්‍රම ආදිය පිළිබඳ පර්යේෂණය කිරීමෙන් ත්‍රිපිටකය එක් අවස්ථාවකදී දේශිත ව නිමාවට පත් වූවක් නොවන බව බොහෝ විද්වතුන්ගේ මතයයි. (Norman, K.R., 1983: 1) ඒ අනුව මෙම ලිපියෙන් ඉදිරිපත් කිරීමට අදහස් කරනුයේ යථෝක්ත ත්‍රිපිටකයේ මූලාරම්භය හා වර්තමානය වනවිට සංවර්ධනය වූයේ කෙසේද? යන්න පැහැදිලි කිරීමටය.

### ගැටලුව

ත්‍රිපිටකයේ සංවර්ධනය සම්බන්ධයෙන් විස්තර කථන දක්නට ලැබෙන චුල්ලවග්ග පාළි හා සමන්තපාසාදිකාවේ ද, එය රචනා කළ බුද්ධඝෝෂ හිමියන් මෙන් ම පසුකාලීන විද්වතුන් විසින් ද දක්වන තොරතුරුවල පරස්පරතා දැකිය හැකිය. ඒ අනුව පාලි ත්‍රිපිටකය ක්‍රමයෙන් සංවර්ධනය වූවක් ද? ඒ සඳහා එළඹිය හැකි සාදක මොනවාද යන්න මෙහි ගැටලුවයි.

### අරමුණ

ත්‍රිපිටකයේ සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රයවල ද විවිධ අදහස් දක්නට ලැබෙන අතර නූතන විද්වතුන්ගේ මතවාද ද ඒ අතර දැකිය හැකිය. මෙම මතවාද සම්බන්ධ තොරතුරු අන්තර්ගත වන්නේ ඒ ඒ තැන්වලය. එම මතවාද ගණනින් කිහිපයක් ඇති බැවින් ඒ සියල්ල එක් ලිපියකින් ගොණුකර දැක්වීමත් එයින් වඩාත් නිරවුල්ව දක්වා ඇති අදහස් පිළිබඳ කරුණු ගවේෂණය කිරීමත් මෙහි අරමුණ වේ.

**සාකච්ඡාව**

**විනය පිටකය**

බුදුරජාණන් වහන්සේ වැඩසිටි පන්සාලිස් වසින් මුල් විසි වසර තුළ දේශනා කරන ලද ධර්මය හඳුන්වා ඇත්තේ 'ධම්ම' යන පදයෙනි. එම කාලය තුළ කිසිදු විනය ශික්ෂා පදයක් පැනවීමට අවශ්‍යතාවක් උද්ගත නොවූ බව සඳහන් වේ. (කංඛාවිතරණී, 1988: 3) ඒ බව මජ්ඣිම නිකායේ කකචූපම සූත්‍රයේ එන බුදුරජුන්ගේ ප්‍රකාශයක් තුළින් ද පැහැදිලි වෙයි.

''ආරාධයිංසු වත මෙ භික්ඛවෙ භික්ඛූ එකං සමයං චිත්තං..... න මෙ භික්ඛවෙ තෙසු භික්ඛූසු අනුසාසනී කරණීයා අහොසි. සතුප්පාදකරණීයමෙව මෙ භික්ඛවෙ තෙසු භික්ඛූසු අහොසි.'' (මජ්ඣිමනිකාය, 2013: 312)

"මහණෙනි, ඒකාන්තයෙන් ම භික්ෂූන් වහන්සේලා මුල් කාලයේ දී මගේ සිත සතුටු කළහ. මහණෙනි, ඒ මුල් අවස්ථාවේ සිටි භික්ෂූන්ට මා විසින් අනුසාසනා කළ යුතු නොවීය. සිහිය ඉපදවීම පමණක් ඒ කාලයේ ප්‍රමාණවත් විය."

ඒකාසන පරිභෝජනය පිළිබඳ දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කෙරෙන භද්දාලි සූත්‍රයේ පෙන්වා දෙන අන්දමට විනය නොපැණ වූ යුගයේ භික්ෂූන් ආචාරශීලී ගති පැවතුම් ඇති ව වාසය කළ බව සඳහන් වේ. (මජ්ඣිම නිකාය, 2013: 176). එසේම මුල් යුගයේ භික්ෂූන්ගේ හික්මීම සඳහා යම් යම් දේශනා පැවැත්වුවත් ඒවා හඳුන්වා ඇත්තේ 'ධම්ම' යන පදයෙන් ම බව

''අහං හි බ්‍රාහ්මණ විනයාය ධම්මං දෙසෙමි රාගස්ස දොසස්ස මොහස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං විනයාය ධම්මං දෙසෙමි'' (අංගුත්තර නිකාය, 2013: 44).

යන පාඨයෙන් පැහැදිලි වේ. ඒ අනුව ධර්මය පළමුවෙන් දේශනා වූ අතර ත්‍රිපිටකය දැක්වීමේ දී පළමුවෙන් විනය පිටකය දක්වා ඇත්තේ කුමන අරමුණින් ද යන්න කෙනෙකුට තර්කයක් ගොඩ නැගීමට හේතු වේ. එය එසේ සිදුකර ඇත්තේ චුල්ලවග්ග පාළියේ

සංගායනා වාර්තාවේ දී පළමුවෙන් උපාලි මහ රහතන් වහන්සේගෙන් විනය විමසීම නිසාය.

''සුණාතු මෙ ආවුසො යදි සංඝස්ස පත්තකල්ලං අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං'' (චුල්ලවග්ග පාළි, 2013: 484).

එසේම විනය සංගායනා කළේ කුමන හේතුවක් නිසාද යන්න සමන්තපාසාදිකාවේ බාහිර නිදාන වණ්ණනාවේ දී පැහැදිලි කර ඇත.

''විනයො නාම බුද්ධසාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති. තස්මා පඨමං විනයං සංගායාමාති'' (සමන්තපාසාදිකා, 1929: 7)

විනය සම්බුද්ධ ශාසනයේ ඉදිරි පැවැත්මට විශේෂයෙන් බලපෑම ඊට හේතුවයි. එම සංගායනාවෙන් පසු විනය පිටකයේ භාරකාරත්වය සංගීතියේ දී විනය දේශනා කළ උපාලි මහරහතන් වහන්සේ ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට භාර වූයේය. (සමන්තපාසාදිකා, 1929: 18) එසේ පරම්පාරවෙන් පැවතගෙන ආ විනය පිටකය ලක්දිව වළගම්බා රාජ්‍ය සමයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු අතර වර්තමානයේ දක්නට ලැබෙන එහි ග්‍රන්ථ 5ක් ඇතුළත් වී ඇත. එනම්:-

1. පාරාජික පාළි
2. පාචිත්තිය පාළි
3. මහාවග්ග පාළි
4. චුල්ලවග්ග පාළි
5. පරිවාර පාළි

යනුවෙනි. මෙම ග්‍රන්ථ පහෙන් (05) පාරාජික හා පාචිත්තිය පාළි දෙක 'උභතො විභංග' ලෙසත්, මහාවග්ග හා චුල්ලවග්ග පාළි දෙක 'ඛන්ධක' ලෙසත්, පරිවාර පාළිය පරිවාර ලෙසත් හඳුන්වා ඇත. එහෙත් සමන්තපාසාදිකා, සුමංගලවිලාසිනි, අත්ථසාලිනි වැනි අටුවා ග්‍රන්ථවල නිර්වචනයට අනුව උභය ප්‍රාතිමොක්ෂයක් ද ඇති බව පෙනෙයි.

''පඨම සංගීතියං සංගීතඤ්ච අසංගීතඤ්ච සබ්බම්පි සමෝධානෙත්වා උභයානි පාතිමොක්ඛානි, ද්වෙ විභංගා, ද්වාවීසති ඛන්ධකා, සොලස පරිවාරාති ඉදං විනය පිටකං නාම'' (සමන්තපාසාදිකා, 1929: 10).

'එහි විනය පිටක කුමක්ද? ප්‍රථම සංගීතියේ දී සංගායනා වූ ද නොවූ ද සියල්ල ගලපා උභය ප්‍රාතිමෝක්ෂය ද, විභංග දෙක ද, ඛන්ධක විසි දෙක ද, පරිවාර දහසය ද යනු මේ විනය පිටකයයි.'

මෙහි සඳහන් වන අන්දමට ප්‍රථම සංගායනාවේ දී සංගායනා වූ මෙන් ම නො වූ සියල්ල විනය පිටකයෙහි ලා සලකා ඇති බව පෙනේ. මෙයින් පැන නඟින ගැටලුව වන්නේ පළමු සංගායනාව් දී සංගායනා නොවූයේ කුමක්ද? යන්නයි. චුල්ලවග්ග පාළියේ පඤ්චසතිකක්ඛන්ධකය හා සත්තසතිකක්ඛන්ධකයත්, කථාවත්ථුප්පකරණය හා සුභ සූත්‍රයත් එසේ සංගායනා නොවූ ඒවා බව සාරත්ථදීපනි ටීකාවෙහි සඳහන් වේ. (සාරත්ථදීපනී ටීකා, 1918: 6) එසේනම් මෙහි සඳහන් වන අන්දමට උභය ප්‍රාතිමොක්ෂයක් විනය පිටකයට ඇතුළත් වූයේ කෙසේද? වර්තමානයේ පවත්නා භික්ෂු - භික්ෂුණී උභය ප්‍රාතිමොක්ෂය විනය පිටයෙහි ලා සංගෘහිත වී නොමැත. එහෙත් භික්ෂුණීන් සඳහා භික්ඛුනී විභංග නම් ශික්ෂාපද සංග්‍රහයක් ද, භික්ෂූන් සඳහා භික්ඛු විභංගය නමින් සංග්‍රහයක් ද සංගායනා වූ බව සමන්තපාසාදිකාව පෙන්වා දෙයි. (සමන්තපාසාදිකා, 1929: 08). එහෙත් අද දක්නට ලැබෙන විනය පිටකය තුළ මෙනමින් ග්‍රන්ථ දෙකක් දක්නට නො ලැබේ. එහෙත් උභය ප්‍රාතිමෝක්ෂයට අයත් කොටස් භික්ඛු - භික්ඛුණී විභංග යන නාමයෙන් හැඳින්වෙන පාරාජික හා පාචිත්තිය පාළි ග්‍රන්ථ දෙකෙහි අන්තර්ගත වී තිබේ.

වර්තමාන විනය පිටකයෙහි ප්‍රාතිමෝක්ෂ යනුවෙන් වෙනම ග්‍රන්ථයක් ඇතුළත් වී නොමැති වුවත් මුල් කාලයේ අන්‍ය නිකායිකයින් විසින් ''භික්ෂු ප්‍රාතිමොක්ෂ'' නමින් ග්‍රන්ථයක් තම පිටක සාහිත්‍ය තුළට ඇතුළත් කර ඇති බවට තොරතුරු හමුවේ. මූල සර්වාස්තිවාද සම්ප්‍රදායේ එන ප්‍රාතිමෝක්ෂය 'ගිල්කිට්' නමින් හැඳින්වෙන ලේඛනයන්හි ද, මහාසාංඝික ලෝකෝත්තරවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂය ටිබෙට් දේශයේ ද, ධර්ම ගුප්තක නිකායේ භික්ෂු හා භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය මධ්‍ය අසියාවේ

කරන ලද කැනීම්වල දී ද සොයාගන්නා ලදැයි නෝර්මන් මහතා පෙන්වා දෙයි. (Norman, K.R., 1983: 39) ඒ අනුව ප්‍රාතිමෝක්ෂය ස්වාධීන ග්‍රන්ථයක් ලෙස ත්‍රිපිටක ග්‍රන්ථ රචනා වූ මුල් යුගයේ සිට විවිධ නිකායයන් විසින් පිළිගෙන ඇති බව පැහැදිලිය. මහා විභංග නමින් සියලු ශික්ෂාපද ඇතුළත් ග්‍රන්ථයක් පළමු සංගායනාවේ දී සංගායිත බව සමන්තපාසාදිකාව සඳහන් කරයි. (සමන්තපාසාදිකා, 1929: 08). මේවා සංසන්දනය කර බැලීමේ දී වෙනස්කම්වලට වඩා සමානකම් රාශියක් හඳුනාගෙන ඇත.

නෝර්මන් මහතාගේ A History of Indian Literature නම් පර්යේෂණ කෘතියට අනුව වැඩි වශයෙන් පර්යේෂණයට භාජනය වූයේ විනය පිටකයයි. ඔහුගේ අදහසට අනුව විනය පිටකය තරම් සංස්කරණයන්ට භාජනය වූ වෙනත් කිසිදු ත්‍රිපිටක ග්‍රන්ථයක් නොමැත. එහි එන ඇතැම් කථා පුවත් ජාතකකථාවන්හි ද, අපදානයෙහි ද ඇත. අංගුත්තර නිකායෙහිත් සඳහන් වන මහ මුහුදෙහි ආශ්චර්යමත් අංග අට චුල්ලවග්ගපාළියේ ද සඳහන් වීමෙන් නෝර්මන් මහතාගේ ප්‍රකාශනයේ සත්‍යතාවක් ඇතැයි සිතිය හැකිය. එසේම චුල්ලවග්ග පාළියේ එන ඇතැම් විස්තර විනය සම්බන්ධයෙන් පමණක් නොව වාර්තාමය ස්වරූපයෙන් ද කරුණු අන්තර්ගත වී ඇති නිසා ඒවා පසුකාලීනව මෙම පිටකයට ඇතුළත් වන්නට ඇතැයි යන්න ද ඔහුගේ මතයයි. (Norman, K.R., 1983: 44)

විනය පිටකයෙහි අවසාන ග්‍රන්ථය වන පරිවාර පාළිය වඩාත් සංස්කරණයන්ට ලක් වූ ග්‍රන්ථයක් ලෙස හැඳින්වීමෙන් නෝර්මන් මහතාගේ මතය තව දුරටත් සනාථ වේ. අටුවාව විස්තර කරන පරිවාර පාළියට වඩා වර්තමානයේ දක්නට ලැබෙන පරිවාරය වාඩාත් විශාල වූවකි. පරිවාර පාළියේ පළමු පරිච්ඡේදයේ අවසානයේ ''භික්ඛු විභංගෙ සොළස පරිවාරා නිට්ඨිතා'' (පරිවාර පාළි, 2013: 187). යනුවෙන් ද දෙවන පරිච්ඡේදය අවසානයේ ''භික්ඛුණී විභංගෙ සොළස මහාවාරා නිට්ඨිතා'' (පරිවාර පාළි, 2013: 375). යනුවෙන් ද සඳහන් වී ඇති අතර වර්තමානයේ මීට වඩා කොටසක් පරිවාර පාළියෙහි අන්තර්ගත වී ඇත. එසේම දෙවන පරිච්ඡේදයෙන් පසුව දක්නට ලැබෙන අනෙකුත් කොටස්වල එන භාෂා ලක්ෂණ ද අනෙකුත් ත්‍රිපිටකාගත ග්‍රන්ථවල එන භාෂාවට වඩා වෙනස්ය. පාලි භාෂාව පිළිබඳ ව හසළ දැනුමක්

නොමැති ආධුනිකයෙකු විසින් කයොර භාෂාවක් උපයෝගි කරගෙන පරිවාරය රචනා කර ඇති බව බැලූ බැල්මට පෙනේ. බුදුරජුන්ගේ භාෂා විශාරදත්වය පිළිබඳ ව දන්නා කෙනෙකුට ඒ බව මැනවින් වැටහේ. මෙහි රචනා ශෛලිය පිළිබඳ ව විමසීමේ දී ද ප්‍රශ්නෝත්තර ක්‍රමයක් අනුගමනය කර ඇත. ග්‍රන්ථාරම්භයේ දී කතුවරයා ප්‍රශ්න රාශියක් ඉදිරිපත් කොට ඇති අතර ඉන්පසුව එම ප්‍රශ්නවලට පිළිතුරු දී ඇත. මේ ක්‍රමවේදය පරිවාරය පුරා දක්නට ලැබේ.

එසේම මෙය ලක්දිව දී සංස්කරණය වන්නට ඇති බව බොහෝ විචාරකයින්ගේ මතයක් වී ඇත. ඊට හේතු වශයෙන් දක්වා ඇත්තේ මෙහි තම්බපණ්ණිය පිළිබඳ සඳහන් වීම, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීම දක්වා තෙරවරුන්ගේ නම් සඳහන් වීම, මහින්ද හිමියන් ප්‍රමුඛ ධර්මදූත පිරිස පිළිබඳ ව විස්තර ඇතුළත් වී තිබීම, ලක්දිවින් නැවත භාරත දේශයට බුදුදහම රැගෙන යාම, 'දීප' නම් භික්ෂුවක් ශිෂ්‍යයින්ගේ ප්‍රයෝජනය සඳහා පරිවාරය රචනා කළ බව සඳහන් වීම යන කරුණු සැලකිල්ලට ගෙන මෙය පශ්චාත් කාලීන ග්‍රන්ථයක් යැයි කීමට බොහෝ විචාරකයෝ පෙළඹෙති. (Norman, K.R., 1983: 44)

**සූත්‍ර පිටකය**

සූත්‍ර පිටකය පිළිබඳ අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ මාහිමියන්ගේ බුද්ධවචනයේ විවරණයක් වන නවංගසත්ථු ශාසනයේ දී 'නිකාය වසෙන පඤ්චවිධං' (සමන්තපාසාදිකා, 1929: 09). යනුවෙන් නිකාය වශයෙන් පස් වැදෑරුම් වන බව දක්වා තිබේ. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය හා ඛුද්දක නිකාය එම නිකාය පහයි. අට්ඨකථා විවරණයෙහි සඳහන් 'සමූහනිවාසාහි නිකායොති වුච්චන්ති' (සුමංගලවිලාසිනි, 1972: 12) 'සමූහවොහොරෙන වා නිකායො' (සමන්තපාසාදිකා, 1929: 12) යන විග්‍රහයට අනුව නිකාය යන්නෙහි තේරුම 'සමූහය' 'කොටස' යන්නයි. එය පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් ද පාලි සාහිත්‍යය නම් කෘතියේ දී වඩාත් විස්තර වශයෙන් දක්වා තිබේ. (බුද්ධදත්ත හිමි, 1998: 261). කනයි ලාල් හස්රා පෙන්වා දෙන අන්දමට නිකාය යන වචනය පෙළෙහි අර්ථ ගණනාවකින් භාවිත වී ඇත. රාශිකරණය, සමාගමය, පන්තිය, ආගමික කණ්ඩායම, වාසස්ථානය, ගෘහය, යනුවෙනි. **(Hazra,**

**K.L., 1932: 177)** සූත්‍ර පිටකයේ එන මෙම ග්‍රන්ථ පඤ්චකයෙහි සංවර්ධනය අධ්‍යයනය කිරීමේ දී විවිධ වර්ධනීය අවස්ථා පෙන්වන නිකායාගත තොරතුරු රාශියක් දක්නට ලැබේ. මෙයින් මුල් නිකාය වන දීඝනිකායෙහි පළමු වර්ගයේ දහවන සූත්‍රය වන සුභ සූත්‍රය (දීඝනිකාය, 2013, 438-482) බුදුරජුන්ගේ පිරිනිවීමෙන් පසු ආනන්ද හිමියන් විසින් තෝදෙය්‍ය පුත් සුභ මානවකයාට දේශනා කරන ලද්දක් බවත්, පායාසි රාජඤ්ඤ සූත්‍රය (දීඝනිකාය, 2013, 504-565) කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් 'පායාසි' නැමති රාජ වංශිකයෙකුට දේශනා කරන ලද්දක් බවත් පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියෝ බුද්ධ භාෂිතය ධර්මස්කන්ධ වශයෙන් අසූහාරදහසක් බව (ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සං) (සමන්තපාසාදිකා, 1929: 09). ගණනය කර ඇති අතර ඉන් දෙදහසක් ම ශ්‍රාවකයන්ගේ දේශනා ලෙස දක්වති. ඒ අනුව මෙම සූත්‍ර පසුකාලීනව දේශනා කරන ලදැයි සිතිය හැකිය. දෙවන වර්ගය වන මහාවග්ගයේ එන මහා පරිනිබ්බාන සූත්‍රය පශ්චාත් කාලීන යැයි විද්වතුන්ගේ මතයයි. මහා පරිනිබ්බාන සූත්‍රයේ බුදුන් පිරිනිවීමෙන් පසුව සිදු වූ ආදාහණ පූජාව, ශාරීරික ධාතුවිභජනය ආදි කොටස් ද අන්තර්ගත වී ඇත. (දීඝනිකාය, 2013, 258-264)

කෙසේ නමුත් පළමු සංගීතියේ දී නිකාය පහ ම සංගායනා වූයේ යැයි ''එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි'' (සමන්තපාසාදිකා, 1929: 09). යනුවෙන් බුදුගොස් හිමියෝ දක්වති. මෙය තහවුරු කිරීමට ප්‍රමුඛ සාධකයක් හමුවන්නේ භාර්හුත් ස්තූපයෙනි. (Cunningham, A.,142). එසේම ක්‍රි. ව. පළමුවන සියවසට අයත් මිලින්දපඤ්හයේ නිකාය පසක් මෙන් ම නිකාය සතරක් ප්‍රගුණ කළ භික්ෂූන් නාගසේන හිමියන් පෙරටු කොටගෙන විසූ බව සඳහන් වේ.

''තෙ ච තෙපිටකා භික්ඛූ පඤ්චනෙකායිකා පි ච

චතුනෙකායිකා චෙව නාගසෙනං පුරක්ඛරුං''

(මිලින්දපඤ්හ, 1962: 18).

නිකාය ග්‍රන්ථ පහෙන් මුල් නිකාය හතර පිළිබඳ ගැටලු බහුල වශයෙන් නොතිබුණත්. අවසාන ඛුද්දක නිකාය පිළිබඳ ව බොහෝ ගැටලු මතු වී තිබේ. මුල් නිකාය හතර සංගායනා වීමෙන් පසු ඒ ඒ

රහතන් වහන්සේලා හා ඔවුන්ගේ ශිෂ්‍ය පරම්පරාවන් වෙත වෙන වෙනම භාරකාරත්වය දුන් බවත් ඔවුන් දීඝභාණක, මජ්ඣිම භාණක ආදි වශයෙන් හැඳින් වූ බවත් ඛුද්දක නිකාය එවැනි පරම්පරාවකට දුන් බවක් සඳහන් නොවීමත් මෙම ගැටලුවට හේතු වේ. ඛුද්දක නිකාය පළමු සංගායනාවෙ දී සංගායනා වූයේ නම් එය ඉදිරියට ගෙන යාම සඳහා භාණක පරම්පරාවකට හිමිවිය යුතුය. මෙය ඛුද්දක නිකායේ සංවර්ධනය සම්බන්ධයෙන් ඇති පළමු ප්‍රශ්නයයි.

එසේම ඛුද්දක නිකාය පශ්චාත්කාලීන යැයි පැවසීමට තවත් නිදසුනක් වශයෙන් පෙන්වා දිය හැක්කේ බුදුරජුන් දේශනා කළ මුල්කාලීන දේශනාවන්හි ගද්‍ය බහුලත්වයක් දක්නට ලැබීමත් ඛුද්දක නිකායේ ඇති ග්‍රන්ථ පසළොසින් වැඩි ප්‍රමාණයක් පද්‍ය බහුල වීමත්ය. පද්‍ය බහුලව දේශනා කළ ඒවා දක්නට ලැබෙන්නේ පසුකාලීනවය.

1. ඛුද්දක පාඨ - මිශ්‍ර එහෙත් පද්‍ය බහුල
2. ධම්මපද - පද්‍යය
3. උදාන - ගද්‍ය හා පද්‍ය
4. ඉතිවුත්තක - මිශ්‍ර එහෙත් පද්‍ය බහුල
5. සුත්තනිපාත - මිශ්‍ර එහෙත් පද්‍ය බහුල
6. පෙතවත්ථු - පද්‍යය
7. විමානවත්ථු - පද්‍යය
8. ථෙරගාථා - පද්‍යය
9. ථෙරීගාථා - පද්‍යය
10. ජාතක - පද්‍යය
11. නිද්දේස - පද්‍ය බහුල
12. පටිසම්භිදාමග්ග - පද්‍ය බහුල

13. අපදාන - පද්‍යය

14. බුද්ධවංස - පද්‍යය

15. චරියාපිටක - පද්‍යය

කෙසේ වුවත් මෙම ග්‍රන්ථ පහළොවෙන් සුත්තනිපාතයේ එන අට්ඨක හා පාරායන වග්ග පැරණි ම යුගයට අයත් යැයි විද්වතුන්ගේ මතයයි. ඛුද්දක නිකායෙහි ඓතිහාසික අනුපිළිවෙළ හෝ සංවර්ධනය පිළිබඳ ව නිවැරදි තොරතුරු අප හමුවෙහි පවත්නා සාම්ප්‍රදායික මූලාශ්‍රයන්ගෙන් දැනගත නොහැකිය. බුද්ධ වචනය පිළිබඳ ව පැරණිම බෙදා දැක්වීම වන නවංගසත්ථු ශාසනයෙහි උදාන, ඉතිවුත්තක, ජාතක යන ව්‍යවහාරයන් දක්නට ලැබේ. මහාචාර්ය මොරිස් වින්ටර්නීඩ්ස් මහතා මෙම අංගත්‍රය ග්‍රන්ථ වශයෙන් නොව දේශනා ශෛලීන් ලෙස හඳුන්වයි. (Winterneeds, M., 1927: 427).

සුමංගලවිලාසිනි නම් දීඝනිකාය අටුවාවේ දී ඛුද්දක ග්‍රන්ථ පිළිබඳ ව දීඝභාණක හා මජ්ඣිම භාණක මත ඉදිරිපත් වේ.

''තතො පරං ජාතකං නිද්දෙසො පටිසම්භිදාමග්ගො සුත්තනිපාතො ධම්මපදං උදානං ඉතිවුත්තකං විමානවත්ථු පෙතවත්ථු ථෙර-ථෙරීගාථාති ඉමං තන්තිං සංගායිත්වා ඛුද්දකගන්ථො නාම අයං'තී ච වත්වා ''අභිධම්මපිටකස්මිංයෙව සංගහං ආරොපයිංසූති දීඝභාණකා වදන්ති.''

''මජ්ඣිමභාණකා පන ''චරියාපිටක අපදාන බුද්ධවංසෙහි සද්ධිං සබ්බම්පි තං ඛුද්දකගන්ථං සුත්තපිටකෙ පරියාපණ්ණන්ති වදන්ති.'' (සුමංගලවිලාසිනි, 1918: 11)

ඒ අනුව දීඝභාණකයන් ඛුද්දක නිකාය ජාතක, නිද්දේස, පටිසම්භිදාමග්ග, සුත්තනිපාත, ධම්මපද, උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පේතවත්ථු සහ ථේර-ථේරීගාථා යන ග්‍රන්ථ එකොළහ (11) පමණක් පිළිගන්නා අතර, එම ග්‍රන්ථ සියල්ලක් ම අභිධර්ම පිටක පර්යාපන්න කෘති සමූහයක් ලෙස දක්වති. මජ්ඣිම භාණකයෝ ඉහත ග්‍රන්ථවලට අමතරව චරියාපිටක, අපදාන, බුද්ධවංස යන ග්‍රන්ථත්‍රයත් සමඟ ඛුද්දක නිකාය ග්‍රන්ථ දහහතරකින් (14) සමන්විත

වන බවත් දක්වා ඒවා සූත්‍ර පිටක පර්යාපන්න ග්‍රන්ථ ලෙසත් දක්වමින් දීඝභාණකයන්ගෙන් වෙනස් වූහ. ඔවුන්ගේ ඒකමතිකත්වය වූයේ වර්තමානයේ ඛුද්දක නිකායෙහි දක්නට ලැබෙන 'ඛුද්දක පාඨය' නොපිළිගැනීමයි. බුද්ධවචනය බෙදා දක්වන 'නිකාය වසෙන පඤ්චවිධං' යන්න විස්තර කෙරෙන ස්ථානයේ දී බුදුගොස් හිමියන් ඛුද්දක නිකාය ඛුද්දක පාඨයත් ඇතුළුව ග්‍රන්ථ පහළොවකින් සමන්විත වූවා පමණක් නොව විනය හා අභිධර්ම පිටකයන් ද ඛුද්දක නිකායට ඇතුළත් කර තිබෙන බවක් පහත දැක්වෙන පාඨයෙන් හා ගාථාවෙන් පෙනේ.

කතමො ඛුද්දකනිකායො? සකලං විනය පිටකං අභිධම්මපිටකං ඛුද්දකපාඨාදයො ච පුබ්බෙ නිදස්සිතපඤ්චදසභෙදා ඨපෙත්වා චත්තාරො නිකායෙ අවසෙසං බුද්ධවචනංති''

ඨපෙත්වා චතුරොපෙතෙ - නිකායෙ දීඝ ආදිකෙ

තදඤ්ඤං බුද්ධ වචනං - නිකායො ඛුද්දකො මතො''

(සුමංගලවිලාසිනි, 1918: 18)

මෙම විග්‍රහයට අනුව නිකාය හතර හැර අනෙක් සියලු බුද්ධවචනය ඛුද්දක නිකාය වන බව මතයකි. ඒ අනුව විනය පිටකාගත කෘති පහත්, අභිධර්ම පිටකාගත කෘති හතත්, ඛුද්දක නිකායේ කෘති පහළොවත් එකතු වූ පසු ඛුද්දක නිකායාගත ග්‍රන්ථ 27 කින් සමන්විත වන බව පෙන්වා දිය හැකිය. ඉහත තොරතුරු අනුව ඛුද්දක නිකාය පිළිබඳ ව අප හමුවෙහි පවත්නා සාදක පහත සඳහන් පරිදි පිළිවෙළින් දැක්විය හැකිය.

1. නවාංගසත්ථුසාසනය - 03
2. දීඝභාණක මතය - 11
3. මජ්ඣිම භාණක මතය - 14
4. බුද්ධඝොෂ මතය i - 15
5. බුද්ධඝොෂ මතය ii - 27

මෙහි දී බුද්ධඝෝෂ හිමියන් ඛුද්දක නිකාය සම්බන්ධයෙන් මත දෙකක් ඉදිරිපත් කර ඇත්තේ අරමුණු දෙකක් පදනම් කරගෙන බව පෙන්වා දිය හැකිය. බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට වැඩම කරන අවස්ථාවේ මහාවිහාර හා අභයගිරි වශයෙන් සම්ප්‍රදාය දෙකක් පැවතුන අතර එයින් මහාවිහාර සම්ප්‍රදායට අනුකූලව අට්ඨකථා රචනා කිරීම බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යභාරය වූ නිසා මහාවිහාර සම්ප්‍රදාය විසින් හස්තසාර ග්‍රන්ථයක් සේ සැලකූ ඛුද්දක පාඨයට නිකාය තත්ත්වය පිරිනැමීම සඳහා එක්තැනෙක ග්‍රන්ථ පහළොවක් සේ දක්වා තිබේ. ඛුද්දක නිකායට විනය පිටකය හා අභිධර්ම පිටකය ඇතුළත් කරන්නට ඇත්තේ අභිධර්මය බුද්ධ භාෂිතයක් නොවේ යැයි පශ්චාත්කාලීන බොහෝ දෙනා පිළිගෙන තිබූ හෙයින් එම මතය වැළැක්වීම සඳහා වන්නට ඇත. උන්වහන්සේගේ මතය මේ යැයි සඳහන් වී ඇතත් මේ සම්බන්ධයෙන් ගැටලු කිහිපයක් ද මතුකළ හැකිය.

1. පූර්ව නිකාය සතර මෙන් ඛුද්දක නිකාය බුද්ධශ්‍රාවකයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් භාණක පරම්පරාවකට නොපැවරුනේ කුමන හේතුවක් නිසාද?

2. අනෙකුත් නිකාය ග්‍රන්ථයන්හි මෙන් ඛුද්දක නිකායේ අන්තර්ගතය හා ශෛලිය ඒකමතික බවක් නැත්තේ කුමක් නිසාද?

3. දීඝභාණකයන් ඛුද්දක නිකාය ග්‍රන්ථ 11 කින් පමණක් සමන්විත වන බව දක්වා එය අභිධර්ම පිටකාපන්න ග්‍රන්ථයක් සේ සැලකුවේ කුමක් නිසාද?

4. අපදාන, බුද්ධවංස හා චරියාපිටක ග්‍රන්ථ ඇතුළු මජ්ඣිම භාණකයන් විසින් ඛුද්දක නිකායික ග්‍රන්ථ සූත්‍ර පිටකයෙහි ලා සැලකූ ප්‍රථම අවස්ථාව මෙයද?

5. අන්‍ය බෞද්ධ සම්ප්‍රදායයන් විසින් ඛුද්දක නිකාය ප්‍රාමාණිකත්වයෙන් නොපිළිගන්නේ කුමන හේතුවක් නිසාද?

මේ අනුව ඛුද්දක නිකායේ ග්‍රන්ථ සියල්ලක්ම පළමු ධර්ම සංගීතියේ දී සංගායනා වූ බවක් දක්නට නොමැත. බුද්ධඝෝෂ හිමියන් ප්‍රථම සංගීතියේ දී ම සම්පූර්ණත්වයට පත් වූ බව පෙන්වා දීමට උත්සහ දැරීමත් අනෙකුත් මතවාද හා ගැටෙන ස්වභාවයක් ඇති බවත් පැහැදිලිව පෙනේ. එසේම ලාංකේය වංසකථාවක් වන දීපවංසය ද ඛුද්දක නිකාය පිළිබඳ ව හඳුන්වා ඇත්තේ මෙසේය.

සවිභත්තා ඉමං ථෙරා - සද්ධම්මං අවිනාසනං

වග්ගපණ්ණාසකං චෙව - සංයුත්තඤ්ච නිපාතකං

ආගම පිටකං නාම - අකංසු සුත්ත සම්මතං

(ඤාණවිමල හිමි, 1959: 23).

මෙහිදී වග්ග වශයෙන් බෙදෙන දීඝනිකායත්, පණ්ණාසක වශයෙන් බෙදෙන මජ්ඣිම නිකායත්, සංයුත්ත වශයෙන් සංයුත්ත නිකායත්, නිපාත වශයෙන් බෙදෙන අංගුත්තර නිකායත් විස්තර කෙරෙන බව දැක්විය හැකිය. ඛුද්දක නිකායේ ග්‍රන්ථ පහළොවක් ඇති අතර ඒවායෙහි නම් වෙන් වෙන් වශයෙන් දක්වා ඇති නිසා නිකාය යන නාමයෙන් ම හඳුන්වා ඇති බව පෙනේ. මහාසාංඝික, හෛමවත, මහිංසාසක හා ධර්මගුත්තික වැනි නිකායයන් විසින් නිකාය ග්‍රන්ථ හඳුන්වා ඇත්තේ ආගම යන නමිනි. එහෙත් ඔවුන්ගේ වර්ගීකරණයට ඛුද්දක නිකායක් ඇතුළත් නොවේ. දීර්ඝාගම, මජ්ඣිමාගම, සංයුක්තාගම, එකෝත්තරාගම වශයෙන් පමණක් ඔවුන් මුල් නිකාය ග්‍රන්ථ හතර පමණක් හඳුන්වා ඇත. (බුද්ධදත්ත හිමි, 1998: 123).

බුරුම පාලි සාහිත්‍ය ඉතිහාසය තුළ ඛුද්දක නිකායට විශේෂ ස්ථානයක් හිමි වේ. ඒ අනුව ඛුද්දක නිකාය ග්‍රන්ථ දහනවයකින් (19) සමන්විත වේ. බුදුගොස් හිමියන් පෙන්වා දෙන ග්‍රන්ථ පහළොවට අමතරව පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා යුගයේ රචිත නෙත්තිප්පකරණ, මිලින්දපඤ්හ, පෙටකොපදෙස හා සුත්තසංගහ යන ග්‍රන්ථයන් ද ඛුද්දක නිකායට අන්තර්ගත වී ඇතැයි දක්වති. (බුද්ධදත්ත හිමි, 1998: 123). ඒ අනුව පළමු සංගායනාවේ දී ඛුද්දක

නිකාය සංගායනා වූ බව පැවසීමට උත්සහ කළත් පශ්චාත්කාලීනව වෙනස් වූ මතවාද ද ඇති වී තිබෙන බව පැහැදිලි වේ.

**අභිධර්ම පිටකය**

අභිධර්ම පිටකයට ධම්මසංගණී, විභංග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යනුවෙන් ග්‍රන්ථ හතක් ඇතුළත් වේ. විනය පිටකය 'පාළි' වශයෙන් ද සූත්‍ර පිටකය 'නිකාය' වශයෙන් ද බෙදා දක්වා ඇති අතර මෙම ග්‍රන්ථ හඳුන්වා ඇත්තේ 'පකරණ' යන නමිනි. අභිධර්මය බුද්ධ භාෂිතයක් යැයි ඔප්පු කිරීමට ධම්මසංගණී අටුවාව වන අත්ථසාලිනිය බොහෝ වෙහෙස ගෙන තිබේ. පිටකත්‍රයේ එන අන් කිසිදු සූත්‍රයක් හෝ ශික්ෂාපදයක් බුද්ධභාෂිතයක් යැයි හැඳින්වීමට වෙහෙස ගත් තැනක් හමු නොවේ. එසේ තිබිය දී අභිධර්මය පමණක් බුද්ධ භාෂිතයක් යැයි හැඳින්වීමට වෙහෙස ගෙන ඇත්තේ මේ සම්බන්ධයෙන් විවිධ මත පැවතීම නිසා විය හැකිය. අභිධර්ම පිටකයට අයත් පස්වෙනි ග්‍රන්ථය වන කථාවත්ථුප්පකරණය බුදුරජුන් පිරිනිවී වසර දෙසිය දහ අටකට පසුව විසූ මොග්ගලීපුත්තතිස්ස හිමියන් විසින් රචිත බව අටුවා පිළිගැනීමයි. එසේම අභිධර්මයට නිදානයක් නැතැයි ඇතමුන් කරන ප්‍රකාශයට පිළිතුරු දෙන අටුවාව සඳහන් කරන්නේ ග්‍රාමවාසී සුමනදේව නම් තෙර නමක් ලෝහ ප්‍රාසාදයේ වැඩසිට ධර්මය දේශනා කරමින්

''එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං තත්‍ර ඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මකථං කථෙසි කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකථා ධම්මාති'' (අත්ථසාලිනි, 1940: 26).

(එක් සමයෙක් හි භාග්‍යවතුන් වහන්සේ තාවතිංස දිව්‍ය ලෝකයෙහි පරසතු මල් උයනේ පණ්ඩු කම්බල පර්වතයෙහි වැඩ වාසය කළ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තවුතිසා වැසි දෙවිවරුන්ට කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා යනුවෙන් අභිධර්ම කථාව වදාළ සේක.)

යන පාඨය දක්වා එය නිදානය යැයි දැක්වූහ. එසේම අභිධර්මය බුදුරජුන් විසින් ම දේශනා කරන ලද්දක්ද යන්නට පිළිතුරු

සපයන අත්ථසාලිනිය ප්‍රථම ආභිධම්මිකයා බුදුරජුන් බවත් එහි වාචනා මාර්ගය සැරියුත් තෙරුන්ගෙන් ප්‍රභවය වී ඇති බවත් දක්වයි.

''අභිධම්මෙ වාචනාමග්ගො පන සාරිපුත්තත්ථෙරප්පභවො... සම්මාසම්බුද්ධෙනෙව පඨමතරං ආභිධම්මිකො.''(අත්ථසාලිනි, 1940: 14,15).

(අභිධර්මයෙහි වාචනාමාර්ගය සාරිපුත්ත තෙරුන්ගෙන් ප්‍රභවය වී ඇත. සම්මාසම්බුදුන් වහන්සේ පළමු ආභිධම්මිකයාණන් වේ.

නමුත් අභිධර්ම යන වචනය මුල් බුදුසමයේ දේශිත සූත්‍ර සාහිත්‍යය තුළ තනි වචනයක් සේ දක්නට නොමැත. එය බොහෝ සෙයින් දක්නට ලැබෙන්නේ අභිවිනය යන වචනය සමගිනි.

''අභිධම්මෙ බො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති. නො සංසාදෙති'' (අංගුත්තර නිකාය, 2013: 520)

පුනචපරං ආවුසො භික්ඛූ ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො.'' (දීඝනිකාය, 2013: 458).

එමණක් නොව බුද්ධ පරිනිර්වාණය සිදුවන අවස්ථාවේ මෙන් ම පළමු ධර්ම සංගායනා අවස්ථාවේ දී ද සියලු දේශනා හැඳින්වීම සඳහා යොදාගෙන ඇත්තේ ධම්ම-විනය යන පද දෙකයි. එම පද දෙක ද බොහෝ සෙයින් එකවර යෙදුන අවස්ථා ත්‍රිපිටකයේ බොහෝ තැන්වලින් සොයා ගත හැකිය.

''යො ඉමස්මිං ධම්මවිනයේ අප්පමත්තො විහෙස්සති'' (සංයුත්ත නිකාය, 2013: 282). (යමෙක් මේ ධර්ම විනයෙහි අප්‍රමාදීව වාසය කෙරෙයි ද?)

''තථාගතප්පවෙදිතො ධම්මවිනයො භික්ඛවෙ විවටො විරොචති නො පටිච්ඡන්නං'' (අංගුත්තර නිකාය, 2013: 510). (මහණෙනි, තථාගතයන් විසින් අවබෝධ කරගත් ධර්මය විවර වූ විට බබළයි. වැසී ඇති කල නොම බබලයි.)

''යො ඛො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මච්චයෙන සත්ථා'' (දීඝනිකාය, 2013: 242). (ආනන්දය, මා විසින් ධර්මය ද විනය ද සංගායනා කරන ලදි. එය මාගේ ඇවෑමෙන් ඔබලාගේ ශාස්තෘන් වන්නේය.)

''හන්ද මයං ආවුසො ධම්මං ච විනයං ච සංගායාමාති'' (චුල්ලවග්ග පාළි, 2013: 546). (මහණෙනි, දැන් අපි ධර්මය ද විනය ද සංගායනා කරමු)

ඉහතින් දැක් වූ ආකාරයට අභිධර්මයේ ප්‍රාමාණිකත්වය පිළිබඳ ව ථෙරවාදි සම්ප්‍රදාය තුළ පිළිගැනීම මෙය වුවත් නූතන විචාරකයින්ගේ හැඟීම අනුව අභිධර්මයේ සප්‍රාමාණිකත්වයට ඍජුව බලපාන කරුණු කිහිපයක් ගෙනහැර දැක්විය හැකිය.

1. අභිධර්මයට විනය සූත්‍රාදි පිටකයන්ට මෙන් නිදානයක් නොමැතිවීම.
2. මූලික දේශනාවන්හි අභිධර්ම යනුවෙන් විශේෂ ධර්ම පර්යායයක් නොතිබීම (අභිධර්මය යන වචනය මුල් බුදුසමයෙහි තිබුණත් එය බොහෝ සෙයින් යෙදී ඇත්තේ අභිවිනය යන පදය සමගිනි)
3. අභිධර්ම පිටකයට අයත් පස්වෙනි ග්‍රන්ථය වන කථාවත්ථුප්පකරණය බුදුරජුන් පිරිනිවී වසර දෙසිය දහ අටක් ගිය තැනේ දී විසූ මොග්ගලීපුත්තතිස්ස තෙරුන් විසින් රචනා වීම.
4. ප්‍රථම ධර්ම සංගායනාවේ දී අභිධර්මය සංගායනා නොවීම හා භාණක පරපුරකට එය නොපැවරීම
5. විවිධ බෞද්ධ සම්ප්‍රදායයන් විසින් වෙනස් වූ අභිධර්ම පිටකයක් හඳුන්වා දීම. සර්වාස්තිවාද අභිධර්මයේ ද පර්යාය යන නම් ඇතිව අභිධර්ම පිටක පර්යාපන්න කෘති 7 ක් දක්වා තිබේ)
6. නිෂ්පුද්ගල, අකර්තෘක ග්‍රන්ථයක් වශයෙන් බොහෝ විද්වතුන් පිළිගැනීම

7. මහාවිහාර සම්ප්‍රදාය තුළ ම අභිධර්මය බුද්ධ භාෂිතයක් ද නැද්ද යන මතවාදය ගොඩ නැගීම.

මේ කරුණු සම්බන්ධයෙන් විවිධ තර්ක ඉදිරිපත් කරමින් අත්ථසාලිනී අටුවාව අභිධර්ම පිටකය මුල් බුදුසමයට ම ඇතුළත් කරන්නට කොතෙකුත් උත්සහ ගෙන ඇති අයුරු හමුවේ. එහෙත් ඒ සම්බන්ධයෙන් විවිධ උගතුන් විසින් විවිධ මතවාද ගොඩ නගා ඇති අයුරු ද දැකිය හැකිය. සමස්ත ත්‍රිපිටකය පිළිබඳ ව පර්යේෂණය කළ නූතන විද්වතුන් අතර ''රීස් ඩේවිඩ්ස්'' මහතා විශේෂ තැනක් උසුලනු ලබයි. එතුමන් විසින් රචිත බෞද්ධ භාරතය නම් කෘතියේ දී මුළු ත්‍රිපිටකයට ම අදාළ වන පරිදි ඓතිහාසික අනුපිළිවෙලක් ඉදිරිපත් කරනු ලබයි. (Davids, R., 2015: 102,103).

1. බුද්ධ වචනය යැයි සැලකිය හැකි කෙටි වාක්‍ය පොත් කිහිපයක ම එකම ක්‍රමයකට සඳහන් වේනම් ඒවා සහ ඇතැම් ශ්‍රාවකයින්ගේ මුවින් කිය වූ යම් ධර්ම කොටස් පොත් කිහිපයක එකම ක්‍රමයකට ඇතුළත් වේනම් ඒවා සූත්‍ර පිටකයෙහි පැරණි ම කොටස්ය.

2. එබඳු කොටස් හෝ කෙටි වාක්‍ය අවම වශයෙන් පොත් තුනකවත් සඳහන් වේනම් එබඳු සංග්‍රහ නැවත සංග්‍රහ කරන ලද පැරණි කොටස් යැයි සැලකේ.

3. විනය පිටකයේ ප්‍රාතිමෝක්ෂ ශීල හා අට්ඨක හා පාරායන වර්ග (සුත්තනිපාත)

4. සූත්‍ර පිටකයේ දීඝ, මජ්ඣිම, සංයුත්ත හා අංගුත්තර නිකාය සතර

5. සුත්ත නිපාතයේ අට්ඨක පාරායන වර්ග හැර අනෙක් කොටස් සහ ථෙරගාථා ථෙරීගාථා, උදාන පාළි, ඛුද්දක පාඨ යන ග්‍රන්ථ

6. සුත්තවිභංග හා ඛන්ධක විනය

7. ජාතක හා ධම්මපද

8. නිද්දේස පාළි, ඉතිවුත්තක පාළි හා පටිසම්භිදාමග්ග පාළි

9. විමානවත්ථු, පෙතවත්ථු, අපදාන, චරියාපිටක හා බුද්ධවංස

10. අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ

මෙම වර්ගීකරණය තුළ ක්‍රමානුකූල බවක් දක්නට ලැබුණත් ඒ ඒ ග්‍රන්ථ රචනා වූ කාලයක් පිළිබඳ තොරතුරු ඇතුළත් වී නොමැති වීම නිසා තරමක් ගැටලු සහගතය. පශ්චාත් කාලීන කෘති වශයෙන් දැක්වෙන ඒවා අනෙක් කෘතිවලට පෙර දක්වා තිබීම පිළිබඳ ව ද සැලකිය යුතු වන්නේය. (ඛුද්දක පාඨය පස්වෙනි අවස්ථාවෙහි දක්වා තිබීම) මෙම අධ්‍යයනය සිදු වී ඇත්තේ ද නූතන පඬිවරුන් ත්‍රිපිටකයේ සංවර්ධනය සම්බන්ධයෙන් මත ඉදිරිපත් කළ මුල් කාලයේ දීමය. ඊටපසු ප්‍රකට විද්වත් පිරිසක් විසින් ම රීස් ඬේවිඩ්ස්ගේ අදහස්වල අඩුලුහුඩුකම් පෙන්වා දෙමින් ත්‍රිපිටකයේ ක්‍රමික වර්ධනය පිළිබඳ ව වඩාත් සවිස්තර පර්යේෂණ සිදුකර ඇත. ඒ අතරින් තරමක වෙනස් ක්‍රමයකට මත ඉදිරිපත් කළ බිමල් චරන් ලෝ (බී. සී. ලෝ) මහතා ප්‍රමුඛ වේ. ඔහුගේ බෙදීම් 'The Magadas in India' නැමති කෘතියේ දී දක්වා තිබේ. (Law, B.C., 1946, 57).

1. වර්තමාන සූත්‍ර විනය අංකයන්හි එක් වරකට වඩා සඳහන් වන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ සරල ප්‍රකාශන (පන්සිල්, සබ්බපාපස්ස අකරණං, අනෙකජාති සංසාරං ආදිය)

2. එලෙස සඳහන් වන සිදුවීම් හා සාකච්ඡා

3. චුල්ලසීල, මජ්ඣිමසීල, මහාසීල, යන ධර්ම කොටස්, අට්ඨක, පාරායන දෙවර්ගයේ ගාථා, (පෙරවදන් හැර)

4. දීඝනිකායෙහි පළමු වෙළුම, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය හා විනය නීති 152 කින් සමන්විත මුල් ප්‍රාතිමෝක්ෂය

5. දීඝනිකායේ දෙවන වෙළුම හා තෙවන වෙළුම, ථෙර-ථෙරීගාථා, ජාතක, සුත්තවිභංග, පටිසම්භිදාමග්ග, පුග්ගලපඤ්ඤත්ති සහ විභංගප්පකරණ

6. මහාවග්ගය හා චුල්ලවග්ගය, නීති 227කින් සමන්විත ප්‍රාතිමොක්ෂය, විමානවත්ථු, පෙතවත්ථු, ධම්මපද, කථාවත්ථුප්පකරණය

7. චුල්ලනිද්දේස, මහානිද්දේස, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, ධාතුකථා, යමක, සහ පට්ඨාන

8. බුද්ධවංස, චරියාපිටක, අපදාන

9. පරිවාර ග්‍රන්ථ

10. ඛුද්දක පාඨ

ලෝ මහතාගේ මෙම වර්ගීකරණය සිදුකර ඇත්තේ සමස්ත ත්‍රිපිටකය ම ඇතුළත් කොට ය. ලෝ මහතාගේ හා රීස් ඩේවිඩ්ස් මහතාගේ බෙදීම් තුළ ද පසුකාලීනව විනය පිටකයට එකතු වූවා යැයි සැලකෙන ප්‍රාතිමෝක්ෂය ද ඇතුළත් වී තිබීම කැපී පෙනෙයි. එහෙත් මෙම ග්‍රන්ථයන්හි කාලය නිර්ණය කළ හැක්කේ ඒ ඒ ග්‍රන්ථයන්හි තොරතුරු ආශ්‍රය කරගෙනය. දෙදෙනාගේ මතවල යම් යම් වෙනස්කම් දක්නට ලැබෙන බව ද කිවයුතුය. රීස් ඩේවිඩ්ස් මහතා පෙන්වා දෙන ආකාරයට අභිධර්මය එකම යුගයක සම්පූර්ණත්වයට පත් වී තිබේ. එහෙත් ලෝ මහතාගේ පර්යේෂණයේ සඳහන් වන්නේ අභිධර්ම පිටකයේ ඇති ග්‍රන්ථ එක් එක් යුගවල දී සංග්‍රහ වූ ඒවා වශයෙනි. එසේම අභිධර්මයේ අවසානයට සංග්‍රහ වූයේ යැයි සැලකෙන කථාවත්ථුප්පකරණය, ධාතුකථා, යමක හා පට්ඨාන යන ග්‍රන්ථවලටත් පෙර රචනා වී ඇතැයි දක්වයි.

මේ අනුව බලන කළ ත්‍රිපටකය මුල් කාලයේ දී ම රචිත වූවා යැයි ථෙරවාදී සම්ප්‍රදාය විසින් පිළිගන්නා නමුත් එය විවිධ කාලවල දී සංවර්ධනයට භාජනය වෙමින් වර්තමානයේ දක්නට ලැබෙන ආකාරයට සකස් වී ඇති බව වැටහේ. කෙසේ වෙතත් මෙම සංවර්ධනය කලින් කලට සිදුවුවත් එහි අගයෙහි වෙනස්කමක් දැක්විය නොහැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


අංගුත්තර නිකාය, බු. ජ. මු. (2013). නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කංඛාවිතරණී අට්ඨකථාව, හේ. වි. මු. (1988).

දීඝනිකාය, i,ii,iii, පඨමො භාගො බු. ජ. මු. (2013). නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීපවංසය, කිරිඇල්ලේ ඤාණවිමල හිමි, (1959) කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මජ්ඣිම නිකාය, පඨමො භාගො, බු. ජ. මු. (2013). නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මිලින්දපඤ්හ, සංස්. බළන්ගොඩ ආනන්දමෛත්‍රිය නාහිමි, (1962). කොළඹ: අනුලා මුද්‍රණාලය.

සංයුත්ත නිකාය, බු. ජ. මු. (2013). නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සාරත්ථදීපනී ටීකා, හේ. වි. මු., (1918).

සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා, හේ. වි. මු., (1918).


### ද්විතීයික මූලාශ්‍රය


බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (2002). පාලි සාහිත්‍යය, නව මුද්‍රණය, මරදාන: රත්න පොත් ප්‍රකාශකයෝ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (1998). පාලි සිංහල අකාරාදිය, නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Cunningham, A., Stupa of Barhut,

Davids, Rhys, (2015). Buddhist India, New edition, Culcutta:

Hazra, K.L., (1932). Pali Language, Delhi,:

Law, B.C., (1946). The Magadas in Ancient India, London:

Norman, K.R., (1983). A History of Indian Literature, Wiesbadan:

Winterneeds, M., (1927). A History of Indian Literature, London: